සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

**Provincial Department of Education - NWP**

87 S I

පළමු වාර පරීක්ෂණය - 11 ශ්‍රේණිය - 2020

# First Term Test - Grade 11 - 2020

**නම/විභාග අංකය : ............................ සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය - I** **කාලය : පැය 03යි.**

වැදගත් :

- සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- අංක 01 සිට 40 තෙක් ප්‍රශ්න වල දී ඇති 1,2,3,4 පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරන්න.
- ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන්, ඔබ තෝරා ගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.

---

(1) ප්‍රාථමික සන්නිවේදන ක්‍රමයකි.

1. බිත්ති සටහන්
2. ගින්දර
3. දුන්වීම් පුවරු
4. කෘත්‍රිම නාද

(2) සන්නිවේදනයේ විකාශනය තුළ ප්‍රථමයෙන්ම නිර්මාණය වූයේ,

1. හෝඩියයි.
2. සංකේතාක්ෂරයි.
3. රූපාක්ෂරයි.
4. විද්‍යුත් සංඥා තාක්ෂණයයි.

(3) පහත දැක්වෙන්නේ සන්නිවේදන වර්ග භාවිත වන අවස්ථා කිහිපයකි.

A - මනෝ වෛද්‍යවරයෙකු රෝගියෙකු සමඟ කතා කිරීම.

B - සිංහල සාහිත්‍ය සමිතිය පැවැත්වීම.

C - ශිෂ්‍යාවක් තම මව පිළිබඳ කවි පන්තියක් නිර්මාණය කිරීම.


D - පවුලේ සියලු දෙනා එක් වී රූපවාහිනී ටෙලි නාට්‍යයක් නැරඹීම.


ඉහත සන්නිවේදන අවස්ථාවලට අදාළ සන්නිවේදන වර්ග පිළිවලින් නිරූපණය කර ඇති පිළිතුර වන්නේ,

1. අන්තර්වර්තී, අන්තර් පුද්ගල, සමූහ, ජනසන්නිවේදනයයි.
2. අන්තර් පුද්ගල, ජනසන්නිවේදනය, අන්තර් වර්තී, සමූහ සන්නිවේදනයයි.
3. අන්තර්වර්තී, සමූහ, ජනසන්නිවේදනය, අන්තර් පුද්ගල සන්නිවේදනයයි.
4. අන්තර් පුද්ගල, සමූහ, අන්තර්වර්තී, ජනසන්නිවේදනයයි.

(4) කෞමිනීගේ නිවස මෙන් ම ගෙවත්ත ද ඉතා අලංකාර ලෙස නිර්මාණය කර ඇත. මෙය අවාචික සන්නිවේදනයට අනුව,

1. පාරිසරික සාධකයකි.
2. ශාරීරික සාධකයකි.
3. සමාජීය සාධකයකි.
4. දෘශ්‍ය සාධකයකි.

(05) 



ඉහත ආකෘති නිවැරදිව නම් කර ඇති වරණය තෝරන්න.

1. දාම හා රෝද ආකෘතිය.
2. චක්‍රීය හා ඕපාදූප ආකෘතිය.
3. දාම හා ඕපාදූප ආකෘතිය.
4. චක්‍රීය හා රෝද ආකෘතිය.

(6) නිමල් හා කමල් අතර ඇති වූ ගුටිබැට හුවමාරුව පිළිබඳ ව ලැව් ගින්නක් සේ පාසල පුරාම ක්ෂණයෙන් ප්‍රචාරය විය. ඊට බලපා ඇත්තේ,

1. විධිමත් සන්නිවේදනයයි.
2. අවිධිමත් සන්නිවේදනයයි.
3. වාචික සන්නිවේදනයයි.
4. දෘශ්‍ය සන්නිවේදනයයි.

(7) පරිගණකය වෙනුවට යොදා ගත් ආදේශක උපකරණයකි.

1. රෝනියෝ යන්ත්‍රය
2. ෆැක්ස් යන්ත්‍රය
3. ඩිජිටල් අනුපිටපත් යන්ත්‍රය
4. යතුරු ලියනය

(8) නිර්මාල් තමා රචනා කළ නව කථාවක මුල් පිටපත පරිගණකය ආශ්‍රයෙන් සකසා ගන්නා ලදී. එහි දී ඔහු අනුගමනය කළ පියවර කිහිපයක් පහත දක්වේ.

A - අකුරුයෝජනය කිරීම.
E - මුද්‍රණය කිරීම.
B - නැවත සංස්කරණය කිරීම.
F - සෝදුපත් බැලීම.
C - අත් පිටපත සැකසීම.
D - මුල් පිටපත සැකසීම.

මෙහි නිවැරදි අනුපිළිවෙළ වන්නේ,

1. C , A , F , B , E , D
2. D , C , A , B , F , E
3. C , A , B , F , E , D
4. D , A , F , B , E , C

(09) පොතක තිබූ රූපසටහනක් සිසුන්ට විශාලනය කර පෙන්වීමට සම්මන්ත්‍රණය සඳහා පැමිණි දේශකයාට අවශ්‍ය විය. ඒ සඳහා යෝග්‍යතම ප්‍රක්ෂේපණ මාධ්‍ය උපකරණය වන්නේ,

1. බහු මාධ්‍ය ප්‍රක්ෂේපණ යන්ත්‍රයයි.
2. අන්තර් ක්‍රියාකාරී පුවරුවයි.
3. කදා ප්‍රක්ෂේපණ යන්ත්‍රයයි.
4. ක්ෂණික ප්‍රක්ෂේපණ යන්ත්‍රයයි.

(10) ආයතනයකට සම්බන්ධ මාධ්‍ය ශ්‍රමිකයන් ප්‍රධාන ප්‍රභේද දෙකකට වර්ගීකරණය කරයි. ඉන් එක් ප්‍රභේදයක් වන්නේ ප්‍රාදේශීය මාධ්‍යවේදීන් ය. අනෙක් ප්‍රභේදය වන්නේ,

1. මාණ්ඩලික මාධ්‍යවේදීන් ය.
2. පුරවැසි මාධ්‍යවේදීන් ය.
3. නිදහස් මාධ්‍යවේදීන් ය.
4. විශේෂාංග මාධ්‍යවේදීන් ය.

(11) රටක සිව්වන ආණ්ඩුව, ජනමාධ්‍ය ලෙස සැලකීමට හේතු වී ඇත්තේ,

1. රජයේ නාමකරණය අනුව සිව්වන ස්ථානය ලබා දී ඇති නිසා ය.
2. රටේ වංචා, දූෂණ පිළිබඳව දැනුවත් කරන නිසාය.
3. රජය ජනතා අපේක්ෂාවන් ඉටු කරන නිසා ය.
4. රජය මඟින් සිදු කරන යහපත් ක්‍රියාවන් මෙන් ම අයහපත් ක්‍රියාවන් පිළිබඳ ව මහජන මතය අවධි කරන නිසාය.

(12) ජනමාධ්‍ය ආයතනයක හිමිකම සෘජුව ම බලපාන්නේ,

1. මාධ්‍යවේදියා කෙරෙහි ය.
2. ප්‍රතිපත්ති කෙරෙහි ය.
3. ග්‍රාහකයා කෙරෙහි ය.
4. වෙනත් මාධ්‍ය ආයතන කෙරෙහි ය.

(13) ජලය හා තෙල් මිශ්‍ර නොවීමේ මූලධර්මය භාවිතා වන්නේ

1. සමතල මුද්‍රණ ක්‍රමයේ ය.
2. උත්තල මුද්‍රණ ක්‍රමයේ ය.
3. අංකිත මුද්‍රණ ක්‍රමයේ ය.
4. නූතන මුද්‍රණ ක්‍රමයේ ය.

(14) ජනමාධ්‍ය හරහා සංවර්ධනාත්මක චින්තනය ඇති කරන ආකාරය පිළිබඳ ව ඉදිරිපත් වූ ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.

කුමාරි - ආර්ථික තොරතුරු ඉදිරිපත් කිරීමෙන් පමණයි සංවර්ධනාත්මක චින්තනය ඇති කරන්න පුළුවන් වෙන්නේ,

නිමාලි - ඇයි? ගීතවලිනුත් පුළුවන්.

කමලා - ඒ.. විතරක් නෙවෙයි. ටෙලි නාට්‍ය, කාටූන් වගේ දේවල්වලිනුත් පුළුවන්.

යශෝදා - පුද්ගලයන් තුළ සංවර්ධනාත්මක චින්තනය ඇති කරන්න වැඩි මෙහෙයක් ඉටු කන්නේ සමාජ මාධ්‍ය.

මේවා අතරින් සත්‍ය ප්‍රකාශ ඉදිරිපත් කර ඇත්තේ,

1. කුමාරි හා නිමාලී ය.
2. නිමාලී හා කමලා ය.
3. කුමාරි හා යශෝදාය.
4. නිමාලි හා යශෝදා ය.

(15) ගුණදාස කපුගේ මහතා ගැයූ ''දවසක් පැළ නැති හේනේ..'' ගීතය රස විඳීමට කමල්ට හැකි වූයේ ඔහු සතු වූ,

1. රසඥතාවයයි.
2. අධ්‍යාපන මට්ටමයි.
3. නිර්මාණාත්මක චින්තනයයි.
4. සමාජ විඥානයයි.

(16) නිශ්චල කැමරාව බිහි වීමට පදනම් වූ උපකරණය වන්නේ,

1. මැජික් ලන්තෑරුමයි.
2. කැමරා ඔබ්ස්කියුරාවයි.
3. CCTV කැමරාවයි.
4. විද්‍යුත් පිරික්සුම් උපකරණයයි.

(17) සාවද්‍ය ප්‍රකාශය තෝරන්න.

1. වර්තමානයේ ඡායාරූප ගැනීම සඳහා බහුල ලෙස භාවිත වන්නේ අංකිත කැමරා ය.
2. ගත වී යන කාලයෙන් එක් මොහොතක් නවතා ගැනීමට ඡායාරූපයට හැකියාව ඇත.
3. ධන සේයාපටලයකින් ඕනෑම පිටපත් ප්‍රමාණයක් මුද්‍රණය කර ගත හැකි ය.
4. වර්ග අඟලක් තුළ ඇති පික්සල් ප්‍රමාණය වැඩි වන විට ඡායාරූපයක ගුණාත්මක බව වැඩි ය.

(18) යම් සිද්ධියක් සිදු වීමෙන් පසු එම අවස්ථාව හා සම්බන්ධ වෙමින්, අවට සිටින කිහිප දෙනෙකුගේ ද අදහස් ඉදිරිපත් කරමින් සිදු කරන ගුවන් විදුලි වැඩසටහන් ආකෘති ප්‍රභේදය වන්නේ,

1. වාර්තායි.
2. සජීවී විස්තර ප්‍රචාරයි.
3. නිවේදනයි.
4. වාර්තා කථනයි.

(19) තොරතුරු දැන ගැනීමේ පුද්ගල අවශ්‍යතාවක් වන්නේ,

1. විවිධ ජන කොටස්වල සංස්කෘතික වටිනාකම් පවත්වාගෙන යාමට.
2. පෞද්ගලික ව්‍යාපාර පවත්වා ගෙන යාමට.
3. ආගමික කණ්ඩායම්වල කටයුතු පවත්වා ගෙන යාමට.
4. සමාජය සමඟ අන්තර් සම්බන්ධතා පවත්වා ගෙන යාමට.

(20) තොරතුරක් පිළිබඳව මනා පිළිගැනීමක් ඇති වීමට බලපාන ගුණාංග වන්නේ,

1. කාලීන බව හා නිවැරදි බවයි.
2. නිවැරදි බව හා විශ්වසනීය බවයි.
3. සමතුලිත බව හා කැපී පෙනීමයි.
4. පැහැදිලි බව හා කාලීන බවයි.

NWP EXAM

(21) උඩුකුරු පිරමීඩ ආකෘතියට අනුව පිළිවලින් ඉදිරිපත් කරනු ලබන්නේ,
1. සිද්ධිය, හැඳින්වීම, තොරතුරු, නිගමනය හා අවසානයයි.
2. හැඳින්වීම, සිද්ධිය, තොරතුරු, නිගමනය හා අවසානයයි.
3. ශිර්ෂ පාඨය, මුල පාඨය, දේහය, නිගමනය හා අවසානයයි.
4. ශීර්ෂ පාඨය, හැඳින්වීම, දේහය, නිගමනය හා අවසානයයි.

(22) ප්‍රාග් මුද්‍රිත මාධ්‍ය ස්වරූපයකි.
1. සත්‍ය මාර්ගය 2. ඇක්ටා ඩියුර්නා 3. ක්ලම්බු ජර්නල් 4. තිනක්කුරල්

(23) '' පිටු 49 කට නොඅඩු වාර සඟරා හෝ මුද්‍රිත කඩදාසි ගොනුව''
1. පුවත්පතක් වේ. 2. සඟරාවක් වේ.
3. පොතක් වේ. 4. පොත් පිංචක් වේ.

(24) ටැබ්ලොයිඩ් පුවත්පත් සම්බන්ධ නිවැරදි ප්‍රකාශය තෝරන්න.
1. මෘදු, සංවේදී තොරතුරු ඇතුළත් වේ.
2. ජාතික හා අන්තර්ජාතික තොරතුරු ඇතුළත් වේ.
3. පළල් පිටුවලින් යුක්ත වේ.
4. නිශ්චිත හා විධිමත් ආකෘතියක් සහිත වේ.

(25) ඉදිරියෙන් ගමන් කළ ත්‍රී රෝද රථයේ පිටුපස ප්‍රදර්ශනය කර තිබූ වැකිය කවීෂගේ සිත ආකර්ෂණය කළේ ය. ඒ සඳහා ඔහුට උපකාර වූ සන්නිවේදන ස්වරූපය වන්නේ,
1. අන්තර් පුද්ගල සන්නිවේදනයයි. 2. අවාචික සන්නිවේදනයයි.
3. අන්තර් වර්තී පුද්ගල සන්නිවේදනයයි. 4. දෘශ්‍ය සන්නිවේදනයයි.

(26) ගුරුතුමිය ලබා දුන් ප්‍රශ්න සියල්ල පහසුවෙන් අවබෝධ කර ගත් කුමාරි සාර්ථකව පිළිතුරු සැපයුවා ය. ඒ සඳහා ඇයට උපකාරී වූයේ,
1. සාක්ෂරතාවයයි. 2. ශක්‍යතාවයයි.
3. අන්තර්වර්තී පුද්ගල සන්නිවේදනයයි. 4. සංජානන ශක්‍යතාවයයි.

(27) ආරක්ෂක හේතූන් මත ප්‍රධාන පූජනීය ස්ථාන නැරඹීමට පැමිණෙන බැතිමතුන් පරීක්ෂාවට ලක්කරන ලදී. ඒ සඳහා යෝග්‍යතම ක්‍රමවේදය වන්නේ,
1. සංවෘත පරිපථ රූපවාහිනී කැමරා භාවිතයයි.
2. බහු මාධ්‍ය තාක්ෂණික උපකරණ භාවිතයයි.
3. විද්‍යුත් පිරික්සුම් උපකරණය භාවිතයයි.
4. ගමන් මලු ආරක්ෂිත කුටිය තුළ තබා යන ලෙස දැනුවත් කිරීමයි.

(28) කතෝලික සභාව මඟින් නිකුත් කළ පුවත්පතක් වන්නේ,
1. ඥානාර්ථ ප්‍රදීපය යි. 2. ලක්මිණ පහන යි.
3. සත්‍ය මාර්ගය යි. 4. ලංකා ලෝකය යි.

(29) සමාජය තුළ සහජීවනය ඇති කිරීම සඳහා ප්‍රධාන වශයෙන් බලපාන සාධකයකි.
1. වාර්ගිකත්වය 2. මානව හිමිකම් හා වගකීම්
3. මානව ධර්මතා 4. සදාචාරය හා සාර්ධර්ම

NWP EXAM

(30) විවිධ වර්ගයේ සතුන් කිහිප දෙනෙකු ඉතා සමගියෙන් කුරුලු ලෑල්ලට දමා තිබූ ආහාර අනුභව කිරීම දුටු චාමරට එම අවස්ථාව ඡායාරූපයකට ගැනීමට අවශ්‍ය විය. ඒ සඳහා ඔහු භාවිත කළ යුතු කැමරා කාච වර්ගය වන්නේ,

1. පුළුල් කෝණ කාචයයි.
2. සාමාන්‍ය කාචයයි.
3. පටු කෝණ කාචයයි.
4. අති සමීප කාචයයි.

(31) වසර 35 කට පසු විශ්ව විවාහක රූ රැජිණ ශ්‍රී ලංකාවෙන් තේරී පත් වූ බව පසු ගිය දා ජනමාධ්‍ය ඔස්සේ වාර්තා විය. එම සිදුවීමට අදාළව ප්‍රවෘත්තිමය වටිනාකම තීරණය කිරීමෙහි ලා ප්‍රධාන වශයෙන් බලපෑ සාධකය වන්නේ,

1. කැපී පෙනීමයි. 2. සමීප බවයි. 3. අදාළ බවයි. 4. බලපෑම යි.

(32) මාධ්‍යවේදීන්ට ඇතැම් තොරතුරු සෘජුව ඉදිරිපත් කිරීම ගැටලු සහගත වේ. එවැනි අවස්ථාවල තම මතය සමාජ ගත කිරීමට ඔවුන්ට යොදා ගත හැකි පුවත්පත් නිර්මාණශීලී ආකෘති වන්නේ,

1. ප්‍රවෘත්ති හා කාටූන් ය.
2. විශේෂාංග හා කාටූන් ය.
3. තීරු ලිපි හා කතු වැකි ය.
4. තීරු ලිපි හා කාටූන් ය.

(33) A - කම්බියක් ඔස්සේ විදුලි සංඥා යැවීම.

B - කම්බියක් ඔස්සේ හඬ යැවීම.

C - කම්බි රහිතව විදුලි සංඥා යැවීම.

යන අවස්ථා සොයා ගත් පුද්ගලයින් පිළිවෙළින් දක්වා ඇති පිළිතුර තෝරන්න.

1. මාකෝනි, ග්‍රැහැම්බෙල්, මෝස්
2. මෝස්, ග්‍රැහැම්බෙල්, මාකෝනි
3. ග්‍රැහැම්බෙල්, මෝස්, මාකෝනි
4. ගුටෙන්බර්ග්, ග්‍රැහැම්බෙල්, මාකෝනි

(34) I S B N අංකය සම්බන්ධයෙන් නිරවද්‍ය ප්‍රකාශය තෝරන්න.

1. දේශීය වශයෙන් පොතක් පිළිගැනීමට ලක්වන අංකන ක්‍රමයකි.
2. පොතක අන්තර්ගතයේ ගුණාත්මකභාවය පිළිබඳ ව ඉදිරිපත් කරන අංකන ක්‍රමයකි.
3. ජාත්‍යන්තර පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය මඟින් ලබාදෙන අංකන ක්‍රමයකි.
4. ජාත්‍යන්තර පිළිගැනීමට ලක් කරන අංකන ක්‍රමයකි.

(35) ග්‍රාහකයා පොළඹවා ගැනීම සඳහා මාධ්‍ය ආයතන ප්‍රධාන වශයෙන් යොදා ගන්නා ක්‍රමවේදය වන්නේ,

1. ත්‍යාග හා මුදල් ලබා දීම යි.
2. විවිධ සූක්ෂම වූ මනෝවිද්‍යාත්මක ක්‍රම අනුගමනය කිරීම.
3. විනෝදාත්මක වැඩසටහන්වලට වැඩි ඉඩක් ලබා දීමයි.
4. තාක්ෂණිකව තොරතුරු ඉදිරිපත් කිරීමයි.

(36) පුවත්පතක පළ කර තිබූ සුප්‍රසිද්ධ කාන්තාවකගේ ඡායාරූපයක් ගෙන නිමල් තම අතෙහි තිබූ පෑනෙන් ඇයට තිලකයක් ද, උඩු රැවුලක් ද දමා උපැස් යුවළක් පැළඳ සිටින ආකාරයෙන් එම ඡායාරූපය වෙනස් කළේ ය. ඔහුගේ එම ක්‍රියාව,

1. ආචාර ධර්මවලට පටහැනි ක්‍රියාවකි.
2. මානව අයිතිවාසිකම් උල්ලංඝනය කිරීමකි.
3. ප්‍රකාශන නිදහසට ඇති අයිතිවාසිකමකි.
4. නිර්මාණශීලීත්වය නිරූපණය කිරීමකි.

(37) පුවත්පතක පෙළ යන්නට අන්තර්ගත වන්නේ,

1. අකුරු, වචන, කාටූන්
2. වචන, සිතුවම්, කාටූන්
3. අකුරු, ඡේද, සිරස්තල
4. වාක්‍ය, සිරස්තල, කාටූන්

NWPEXAM

(38) ප්‍රවෘත්ති සම්බන්ධයෙන් ඉදිරිපත් කර ඇති සාවද්‍ය ප්‍රකාශය තෝරන්න.

1. ලොව සිදුවන අසාමාන්‍ය සිදුවීම් සියල්ල ප්‍රවෘත්ති බවට පත් වේ.
2. දෘඪ පුවත් ඕනෑම සමාජයකට දැඩි බලපෑමක් සිදු කරයි.
3. සෑම තොරතුරක් ම ප්‍රවෘත්තියක් බවට පත් වේ.
4. $W_5$ හා H සංකල්පයට අනුව ප්‍රවෘත්ති රචනා කිරීමෙන් ප්‍රවෘත්තියක අවසාන කොටස් ඉවත් කිරීමට හැකි වේ.

(39) රාජ්‍ය ආයතනයක සිදු වූ වංචාවක් සම්බන්ධව ගුවන්විදුලි ප්‍රවෘත්ති මඟින් තොරතුරු ඉදිරිපත් කිරීමේ දී වඩාත් වැදගත් කරුණක් වන්නේ,

1. සංඛ්‍යා දත්ත සහිතව තොරතුරු ඉදිරිපත් කිරීම.
2. කරුණු තහවුරු කිරීමට අදාළ වන පුද්ගලයන්ගේ හඬ කොටස් ඉදිරිපත් කිරීම.
3. සවිස්තරාත්මක ව තොරතුරු ඉදිරිපත් කිරීම.
4. විවිධ පුද්ගලයන් ඒ සම්බන්ධයෙන් දක්වන මත ඉදිරිපත් කිරීම.

(40) පහත දැක්වෙන්නේ පුවත්පත් වෙළඳ දැන්වීම් සම්බන්ධයෙන් ඉදිරිපත් වූ අදහස් කිහිපයකි.

සුජිත් - මුල් පිටුවේ දැන්වීම් පළ කරන විට අදාළ මිල ගණන් ඉහළ යනවා

සුමිත් - ලුහුඬු දැන්වීම්වල මිල නියම කරන්නේ එයට යන ඉඩ ප්‍රමාණයට හා වචන ප්‍රමාණයට අනුවයි.

පූජිත් - වෙළඳ දැන්වීම් පළ කරන පිටුව අනුව වගේම වර්ණ භාවිතය අනුවත් ගාස්තු වෙනස් වෙනවා.

මෙයින් නිවැරදි ප්‍රකාශ ඉදිරිපත් කර ඇත්තේ,

1. සුජිත් හා සුමිත් ය.
2. සුමිත් හා සුජිත් ය.
3. සුජිත් හා පූජිත් ය.
4. සුජිත්, සුමිත් හා පූජිත් යන තිදෙනාම ය.

NWP EXAM

සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

Provincial Department of Education - NWP

87 | S | II

පළමු වාර පරීක්ෂණය - 11 ශ්‍රේණිය - 2020

# First Term Test - Grade 11 - 2020

**නම/විභාග අංකය : ............................සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය - II** කාලය : පැය 02යි.

වැදගත් :

- පළමු ප්‍රශ්නය හා තෝරා ගත් තවත් ප්‍රශ්න හතරක් ද ඇතුලු ව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.
- පළමුවැනි ප්‍රශ්නයට ලකුණු 20 ක් හිමි වන අතර, අනෙකුත් සෑම ප්‍රශ්නයකට ම ලකුණු 10 බැගින් හිමි වේ.

## II කොටස

(01) ප්‍රවීණ සන්නිවේදන විශාරදයෙකු වූ රනිල් විසින් ''මාධ්‍යයේ නව ප්‍රවණතා'' නමින් ග්‍රන්ථයක් රචනා කළේ ය. ඔහු විසින් පොත දොරට වැඩීමේ උත්සවයක් ද සංවිධානය කරන ලදී.

i) පොත දොරට වැඩීමේ උත්සව අවස්ථාව කුමන සන්නිවේදන වර්ගයට අයත්වේද?
ii) මාධ්‍ය වර්ගීකරණයට අනුව පොතක් අයත්වන මාධ්‍ය ප්‍රභේදය කුමක්ද?
iii) පොත මුද්‍රණය කිරීම සඳහා ඔහුට යොදා ගත හැකි මාධ්‍ය උපකරණයක් දක්වන්න.
iv) පොතේ නිමි කටයුතු සඳහා යොදාගත හැකි මාධ්‍ය උපකරණ දෙකක් ලියන්න.
v) ග්‍රන්ථය රචනා කිරීමේ දී උපකාර කර ගත්තේ යැයි සිතිය හැකි තොරතුරු මූලාශ්‍ර දෙකක් දක්වන්න.
vi) පොත පිළිබඳ ව අදාළ පාඨකයන් දැනුවත් කිරීම සඳහා යොදා ගත හැකි ක්‍රමවේද දෙකක් දක්වන්න.
vii) මෙම ග්‍රන්ථයෙහි දක්නට ඇතැයි සිතිය හැකි මාධ්‍ය බාධක දෙකක් දක්වන්න.
viii) අත්පිටපත රචනයේ දී රචකයා අවධානය යොමු කළ යුතු කරුණු දෙකක් දක්වන්න.
ix) පොතක අන්තර්ගත ලක්ෂණ දෙකක් ලියන්න.
x) ඒ ඒ කරුණුවලට අදාළ ව ඡායාරූප කිහිපයක් ද පොතෙහි අන්තර්ගත කර තිබුණි. ඡායාරූප ඇතුළත් කිරීමෙන් ලැබෙන ප්‍රයෝජන දෙකක් දක්වන්න.

(ලකුණු 2X10=20)

(02) මාධ්‍ය විෂයභාර ගුරුතුමා සිසුන් සමග පුවත්පතක් නිර්මාණය කිරීමට තීරණය කළේ ය.

i) පුවත්පතක අන්තර්ගත ලිපි ආකෘති ප්‍රභේද දෙකක් නම් කරන්න. (ලකුණු 1)
ii) පුවත්පතක දැකිය හැකි රූපන ප්‍රකාශන දෙකක් කෙටියෙන් හඳුන්වන්න. (ලකුණු 2)
iii) මිනිසා මුද්‍රණ ශිල්පය සොයා ගැනීම කෙරෙහි පෙළඹවීමට බලපෑ හේතු තුනක් පැහැදිලි කරන්න. (ලකුණු 3)
iv) සෑම පුද්ගලයෙකුට ම තම පෞද්ගලික අවශ්‍යතා ඉටු කර ගැනීමේ දී තොරතුරු භාවිතා කිරීමට සිදු වේ. එසේ තොරතුරු යොදා ගන්නා අවස්ථා හතරක් පැහැදිලි කරන්න. (ලකුණු 4)

(03) නාගරික පාසලකට ඇතුළත් වූ ගිහාන්ට එහි විවිධ සන්නිවේදන ක්‍රම යොදා ගන්නා ආකාරය දැක ගත හැකි විය.

i) පාසල තුළ ක්‍රියාත්මක වන සන්නිවේදන වර්ග දෙකක් නම් කරන්න. (ලකුණු 1)
ii) පාසල තුළ දෘශ්‍ය සන්නිවේදනය භාවිත කළ අවස්ථා ද බහුලව දැකිය හැකි විය. එවැනි අවස්ථා දෙකක් උදාහරණ මඟින් පැහැදිලි කරන්න. (ලකුණු 2)
iii) පාසල යනු විධිමත් සන්නිවේදනයක් ක්‍රියාත්මක වන ආයතනයකි. කරුණු තුනක් මඟින් පැහැදිලි කරන්න. (ලකුණු 3)
iv) අංකික තාක්ෂණය මඟින් ලබා ගත් ඡායාරූප කිහිපයක් පාසල් බිත්ති පුවත්පතක ප්‍රදර්ශනය කර තිබුණි. අංකික ඡායාරූප තාක්ෂණයේ විශේෂතා හතරක් පැහැදිලි කරන්න. (ලකුණු 4)

NWP EXAM

(04) විවිධ කාර්යයන් සඳහා මාධ්‍ය තාක්ෂණික උපකරණ භාවිතා කරයි.

i) මුදල් ගනුදෙනු කිරීමේ දී භාවිතා කරන කාර්යාලීය මාධ්‍ය උපකරණ දෙකක් නම් කරන්න. (ලකුණු 1)

ii) පරිගණක මුද්‍රණ යන්ත්‍ර දෙකක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 2)

iii) ප්‍රක්ෂේපණීය හා ප්‍රක්ෂේපණීය නොවන මාධ්‍ය අතර දැකිය හැකි අසමාන ලක්ෂණ 3 ක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 3)

iv) අංකිත තාක්ෂණය මඟින් ලබා ගත් ඡායාරූප කිහිපයක් පාසල් බිත්ති පුවත්පතක ප්‍රදර්ශනය කර තිබුණි. අංකිත ඡායාරූප තාක්ෂණයේ විශේෂතා හතරක් පැහැදිලි කරන්න. (ලකුණු 4)

(04) විවිධ කාර්යයන් සඳහා මාධ්‍ය තාක්ෂණික උපකරණ භාවිතා කරයි.

i) මුදල් ගනුදෙනු කිරීමේ දී භාවිතා කරන කාර්යාලීය මාධ්‍ය උපකරණ දෙකක් නම් කරන්න. (ලකුණු 1)

ii) පරිගණක මුද්‍රණ යන්ත්‍ර දෙකක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 2)

iii) ප්‍රක්ෂේපණීය හා ප්‍රක්ෂේපණීය නොවන මාධ්‍ය අතර දැකිය හැකි අසමාන ලක්ෂණ 3 ක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 3)

iv) දුරකතන සන්නිවේදනය පදනම් කරගනිමින් ඉදිරිපත් කළ සන්නිවේදන ආකෘතිය නම් කර, එහි මූලික අංග තුනක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 4)

(05) ජනමාධ්‍ය යනු ජනතාව වෙත තොරතුරු ලබා දෙන ප්‍රධාන මූලාශ්‍රයකි.

i) පෞද්ගලික හිමිකාරිත්වය යටතේ ආරම්භ වී පසුව රජයට පවරා ගත් මාධ්‍ය ආයතන දෙකක් නම් කරන්න. (ලකුණු 1)

ii) ජනමාධ්‍ය මඟින් වාර්ගිකත්වය නියෝජනය කිරීමේ දී අවධානය යොමු කළ යුතු කරුණු දෙකක් දක්වන්න. (ලකුණු 2)

iii) තොරතුරු සන්නිවේදනයේ දී ඡායාරූප ප්‍රබල මෙහෙයක් ඉටු කරයි. පුවත්පතක දැකිය හැකි ඡායාරූප ප්‍රභේද තුනක් උදාහරණ මඟින් පැහැදිලි කරන්න. (ලකුණු 3)

iv) ජනමාධ්‍ය මඟින් සමාජය වෙත ඉටු කළ යුතු යුතුකම් හතරක් පැහැදිලි කරන්න. (ලකුණු 4)

(06) නව මාධ්‍ය උපකරණ බිහිවීම සන්නිවේදන තාක්‍ෂණයේ ප්‍රවණතාවයකි.

i) පැරණි මාධ්‍ය අභියෝගයට ලක් කරමින්, සන්නිවේදන අධ්‍යයන ක්ෂේත්‍රයට, අලුතින් එක් වී ඇති මාධ්‍ය කිනම් නමකින් හැඳින්වේද? (ලකුණු 1)

ii) එම මාධ්‍යයේ ලක්ෂණ දෙකක් දක්වන්න. (ලකුණු 2)

iii) ෆැක්ස් මඟින් ලිපියක් යැවීම සඳහා තිබිය යුතු පහසුකම් තුනක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 3)

iv) පාඨකයා අනුව පුවත්පත් පළ කිරීමෙන් ලැබෙන වාසි හතරක් විස්තර කරන්න. (ලකුණු 4)

(07) i) නාභිය දුර වෙනස් කරමින් ඡායාරූප ගැනීමට හැකි කාච වර්ගය නම් කරන්න. (ලකුණු 1)

ii) ප්‍රවෘත්තියක විශ්වසනීයත්වය ඇති වීම කෙරෙහි බලපාන සාධක දෙකක් කෙටියෙන් හඳුන්වන්න. (ලකුණු 2)

iii) මානව සමාජයේ පැවැත්මට අන්තර්පුද්ගල සන්නිවේදනය වැදගත් වන ආකාරය කරුණු තුනක් මඟින් පැහැදිලි කරන්න. (ලකුණු 3)

iv) රටක ආර්ථික සංවර්ධනය සඳහා ජනමාධ්‍යයට දායක විය හැකි ආකාරය කරුණු හතරක් මඟින් පැහැදිලි කරන්න. (ලකුණු 4)

NWP EXAM